# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1659/16 - 2010 ජුනි 22 වැනි අඟහරුවාදා - 2010.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ පැලියගොඩ නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොටගෙන පැලියගොඩ නගර සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

රණේපුර දේවගේ පියසිරි සෙනෙවිරත්න නම් වූ සභිකයා අයත් වන වූ එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ පැලියගොඩ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන මාකාවිටගේ ලක්ෂ්මන් රෝහන පෙරේරා මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පැලියගොඩ නගර සභාවේ තේරීම්භාර නිලධාරී මොහමඩ් මහ්දූම් මොහමඩ් වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මාකාවිටගේ ලක්ෂ්මන් රෝහන පෙරේරා මහතා පැලියගොඩ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. මොහමඩ්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
පැලියගොඩ නගර සභාව.

2010 ජුනි මස 16 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
ගම්පහ.

7-248


1A - G 13022 — 350 (2010/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.